# තනතුරු ඇබෑර්තු

# මොරටුව මහා නගර සභාව

මොරටුව මහා නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් විවෘතව අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු III ශ්‍රේණිය | 07 | PL3-2016 | 25,790 - 10x270 10x300-10x330 12x350-38,990/- | **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**<br>අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය. |

- **බඳවා ගැනීමේදී අ.පො.ස.(සා.පෙළ) සමතුන් නොමැති විට 8 ශ්‍රේණිය සමතුන්ගෙන් බඳවා ගනු ලැබේ.**

**වෘත්තීය සුදුසුකම්**

i බර වාහන බලපත්‍රය (භාර බර) හොන්ඩර 34 වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගින් 32 ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතා පිළිබඳව සහතිකයක් හෝ ඒ පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඩී පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

ii අවම උස අඩි 5 ක් විය යුතුය.

iii බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 4 මට්ටමට අදාළ සහතිකපත් තිබිය යුතුය.

iv මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් තිබිය යුතුය.

**පළපුරුද්ද**

i. බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුර සඳහා එම යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව එක් වසරක පළපුරුද්දක් ලබාතිබීම.

**වයස :** අවම වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

උපරිම වයස් සීමාව : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| මාර්ග නීති පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 30 | 50% |
| යාන්ත්‍රික ක්‍රියාකාරීත්වය හා එහි පැවැත්ම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 50 | |
| ප්‍රායෝගික පරීක්ෂණය | 15 | |
| පෞරුෂත්වය | 05 | |

*** සටහන :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බැලේ.

**බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුරු සඳහා විවෘතව බඳවා ගැනීමේදී අදාළ වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ විෂය නිර්දේශය**

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| මාර්ග නීති පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 30 | 50% |
| යාන්ත්‍රික ක්‍රියාකාරීත්වය හා එහි පැවැත්ම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 50 | |
| ප්‍රායෝගික පරීක්ෂණය<br>බඳවා ගැනීමට යෝජිත බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම පිළිබඳ අයදුම්කරුගේ ශිල්පීය හැකියාව හා ප්‍රවීණතාව මෙහිදී පරීක්ෂා කරනු ලැබේ. | 15 | |
| පෞරුෂත්වය<br>සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය මෙහිදී පරීක්ෂා කරනු ලැබේ. | 05 | |

**බඳවා ගැනීමේ කොන්දේසි :**

01. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
02. අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
03. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
04. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු හෝ දඬුවම් ලැබුවකු නොවිය යුතුය.
05. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.
06. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.
07. අදාළ බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධාන අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් යොමු කරනු ලබන අතර, එහිදී ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.
08. කිසියම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි පමණින් එම අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස සලකනු නොලැබේ.

**සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :**

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාමක වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
02. බඳවා ගනු ලබන අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.
03. මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා බස්නාහිර පළාත් සභාව වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කලින් කල පනවනු ලබන නියමයන්ට හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

**අයදුම්පත් එවිය යුතු ආකාරය :**

01. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු අතර, අයදුම්පත් **2020.02.26 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව, යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් හෝ අතේ ගෙනවිත් භාරදිය යුතුය.** ඉල්ලුම් කරන තනතුර අයදුම්පතේ සහ කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.
02. මෙම දැන්වීමේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්‍ර ලෙස සලකා ප්‍රතික්ෂේප කෙරේ.
03. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය. එසේ එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
    - උප්පැන්න සහතිකය
    - අධ්‍යාපන සහතික (ප්‍රතිඵල සනාථ කිරීමේ සහතිකය ඇතුළුව)
    - පළපුරුද්ද සනාථ කෙරෙන සහතික
04. යම් අයදුම්කරුවකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවර වල බහා ඉදිරිපත් කළ යුතුය.

**2020.02.18 වන දින**
**මොරටුව මහා නගර සභාවේදීය.**

**එස්. ඩී. තෙවරප්පෙරුම**
**නාගරික කොමසාරිස්,**
**මොරටුව මහා නගර සභාව.**

## ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහා නගර සභාවේ ................................. තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම : ........................................
02. මුලකුරු වලින් හැඳින්වෙන නම : ........................................
03. ස්ථිර ලිපිනය : ........................................
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ........................................
05. ජාතික හැඳුනුම්පත් අංකය : .................... දුරකථන අංකය : ....................
06. උපන් දිනය : අවුරුද්ද : .................... මාසය : .................... දිනය : ....................
07. ජාතිය : ........................................
08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු .................... මාස : .................... දින : ....................
09. ස්ත්‍රී/ පුරුෂ භාවය : ........................................
10. විවාහක / අවිවාහක බව : ........................................
11. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද ? : ........................................
12. අධ්‍යාපන සුදුසුකම් : ........................................
13. වෘත්තිය සුදුසුකම් හා පළපුරුද්ද : ........................................
14. වෙනත් සුදුසුකම් : ........................................
15. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඒ පිළිබඳ විස්තර
    i. දැනට දරන තනතුර : ........................................
    ii. අනියම් / තාවකාලික / ආදේශක / කොන්ත්‍රාත්ද යන වග? : ........................................
    iii. එම තනතුරට පත් වූ දිනය : ........................................
16. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද?

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දනිමි.

........................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ....................

දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරු/ කාරිය වන .................... මහතා/ මහත්මිය / මෙනවිය මෙම ආයතනයේ .................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත්, ඔහු/ ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන

නම : ........................................
තනතුර : ........................................
නිල මුද්‍රාව : ........................................

Source: Diniamina (2020.02.20)